සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

103972

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

21 S II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2002 අප්‍රේල්
கல்விப் பொதுத் தராதரப்பத்திர (உயர் தர) ப் பரீட்சை, 2002 ஏப்பிரல்
General Certificate of Education (Adv. Level) Examination, April 2002

ආර්ථික විද්‍යාව II
பொருளியல் II
Economics II

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

www.pastpaperlk.com
www.artsapi.lk

## II කොටස

"අ" උප කොටසින් ප්‍රශ්න **දෙකක්** ද,
"ආ" උප කොටසින් ප්‍රශ්න **දෙකක්** ද, තෝරාගෙන ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

---

### "අ" උප කොටස

(මේ කොටසින් ප්‍රශ්න **දෙකක්** තෝරා ගන්න.)

1. (i) පුළුල් මුදල් යනු එක් සමජාතීය වත්කමක් නොව විවිධ වත්කම් පරාසයක් ආවරණය වන්නකි. මේ ප්‍රකාශය විමසන්න.
   (ii) පුළුල් මුදල් සංකල්පයක ප්‍රයෝජනය කුමක් ද?
   (iii) පුද්ගලයින් තම වත්කම්වලින් කොටසක් ආදායමක් නො ලැබෙන වත්කමක් වන මුදල්වලින් තබා ගන්නේ මන් ද?
   *(එක් කොටසකට ලකුණු 05 යි)*

2. (i) වාණිජ බැංකුවක ණය මැවීමේ හැකියාව සීමා කෙරෙන සාධක කවරේ ද?
   (ii) පොලී අනුපාතිකයේ ඉහළ යෑමක ආර්ථික ප්‍රතිවිපාක කවරේ ද?
   (iii) මහ බැංකුව විවෘත වෙළෙඳපොළෙන් සුරැකුම්පත් මිලට ගනී. මේ ක්‍රියාවේ ආර්ථික ප්‍රතිඵල කවරේ ද?
   *(එක් කොටසකට ලකුණු 05 යි)*

3. උද්ධමනයක් පහත දැක්වෙන දෑ කෙරෙහි කෙසේ බලපාන්නේ ද?
   (i) ආනයන
   (ii) අපනයන
   (iii) විනිමය අනුපාතය
   *(එක් කොටසකට ලකුණු 05 යි)*

4. (i) සංවෘත ආර්ථිකයක සිට "විවෘත ආර්ථිකයකට" මාරු වන විට රටක් ලබන ආර්ථික වාසි කවරේ ද?
   (ii) සඵල ආරක්ෂණ අනුපාතය ගණනය කරන්නේ කෙසේ ද?
   (iii) ආරක්ෂණයේ ආර්ථික පිරිවැය කවරේ ද?
   *(එක් කොටසකට ලකුණු 05 යි)*

[ දෙවෙනි පිටුව බලන්න.

## "ආ" උප කොටස

(මේ කොටසින් ප්‍රශ්න **දෙකක්** තෝරා ගන්න.)

5. (i) **"සේවා වියුක්තිය"** සහ **"ඌණ සේවා නියුක්තිය"** අතර වෙනස පැහැදිලි කරන්න.

(ii) සංවර්ධන ප්‍රශ්න අවබෝධ කර ගැනීම සඳහා ඌණ සේවා නියුක්ති සංකල්පයේ වැදගත්කම පැහැදිලි කරන්න.

(iii) මෑත වර්ෂවල දී ශ්‍රී ලංකාවේ සේවා වියුක්තියෙහි දකිය හැකි විශේෂිත ලක්ෂණ කවරේ ද?

*(එක් කොටසකට ලකුණු 05 යි)*

6. ආර්ථික වර්ධනය, සංවර්ධනය සඳහා අත්‍යවශ්‍ය දෙයකි. එහෙත් ආර්ථික වර්ධනය මගින් අනිවාර්යයෙන් ම සංවර්ධනයක් බිහි නොවේ.

(i) සංවර්ධන ක්‍රියාවලියක් බිහි කිරීම සඳහා ආර්ථික වර්ධනය අත්‍යවශ්‍ය දෙයක් සේ සැලකෙන්නේ මන්ද?

(ii) සංවර්ධන ක්‍රියාවලියක් සඳහා ආර්ථික වර්ධනය හැරෙන්නට අවශ්‍ය අනෙකුත් සාධක කවරේ ද?

(iii) ආර්ථික වර්ධනයක් සංවර්ධනය කරා යොමු කිරීම සඳහා රජයක් විසින් ක්‍රියාත්මක කළ හැකි නිශ්චිත ප්‍රතිපත්ති කවරේ ද?

*(එක් කොටසකට ලකුණු 05 යි)*

7. (i) ඇමෙරිකානු ඩොලර් යොදා ඒක පුද්ගල ආදායම් අන්තර්ජාතික වශයෙන් සැසඳූවිට රටවල් අතර පවතින ආදායම් පරතර අතිශයෝක්තියෙන් දක්වේ. මෙයට හේතු කවරේ ද?

(ii) රටවල් අතර පවතින ආදායම් පරතර පිළිබඳ වඩාත් තාත්ත්වික පින්තූරයක් ලබා ගැනීම සඳහා යොදගන්නා ක්‍රමය කුමක් ද?

(iii) ශ්‍රී ලංකාවේ සහ අමෙරිකාවේ ඒක පුද්ගල ආදායම් සැසඳීමෙන් ඉහත (i) සහ (ii) කොටස්වලට සැපයෙන පිළිතුර පැහැදිලි කරන්න.

*(එක් කොටසකට ලකුණු 05 යි)*

8. 2000 ශ්‍රී ලංකා ආර්ථිකයේ කාර්ය සාධනය පිළිබඳ වාර්තාවක් පහත අංශ පිළිබඳ විශේෂ අවධානය යොමුකරමින් ඉදිරිපත් කරන්න.

(i) නිෂ්පාදන වර්ධනය

(ii) මිල මට්ටම

(iii) රාජ්‍ය අයවැය කටයුතු

(iv) ගෙවුම් ශේෂය හා විනිමය අනුපාතය

*(ලකුණු 15 යි)*

***

www.pastpaperlk.com www.artsapi.lk